43801

AL/2019/33/S-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.22 0830 - 1030

ගිණුම්කරණය I
கணக்கீடு I
Accounting I

33 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.**
* අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ තිත් ඉරි මත ලියන්න.**
* සෑම ප්‍රශ්නයකටම **සමාන** ලකුණු හිමි වේ.
* **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.

විභාග අංකය : ..............................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| | අත්සන | සංකේත අංක |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති/ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

**1.** පහත කුමන ප්‍රකාශයෙන් ආයතනයක ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ **වඩාත් හොඳින්** විස්තර කරනු ලබයි ද?
(1) ආයතනයක ගනුදෙනු ගිණුම් පොත්වල සටහන් කිරීම.
(2) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ආයතනයක ගනුදෙනු සටහන් කිරීම.
(3) ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව ආයතනයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
(4) කළමනාකරුවන්ගේ භාවිතය සඳහා ආයතනයක මූල්‍ය තොරතුරු සන්නිවේදනය කිරීම.
(5) ආයතනයක ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා තොරතුරු සන්නිවේදනය කිරීම. (......)

**2.** ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ පහත පියවර සිදුවන **නිවැරදි** අනුපිළිවෙළ කුමක් ද?
A - ලෙජර් ගිණුම් තුලනය කිරීම
B - ගනුදෙනු සඳහා මූලාශ්‍ර ලේඛන පිළියෙල කිරීම
C - ගනුදෙනු මූලික සටහන් පොත්වල සටහන් කිරීම
D - ශේෂ පිරික්සුම පිළියෙල කිරීම
E - ජර්නල් සටහන් ලෙජරයට පිටපත් කිරීම

(1) B, C, A, E, D (2) B, C, E, A, D (3) B, C, E, D, A
(4) C, B, E, A, D (5) C, B, D, E, A (......)

● **අංක 3, 4 සහ 5 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2019.01.01 දින මුදලින් රු. 750 000 ක් ආයෝජනය කරමින් සඳුන් විසින් වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලද අතර 2019 ජනවාරි මාසයේ දී පහත ගනුදෙනු සිදු විය.

| දිනය | විස්තරය |
|---|---|
| 2019.01.10 | ජයමාල් වෙළෙඳුන්ගෙන් රු. 500 000 ක භාණ්ඩ ණයට මිල දී ගන්නා ලදී. |
| 2019.01.12 | ජයමාල් වෙළෙඳුන්ගෙන් මිල දී ගත් රු. 50 000 ක භාණ්ඩ ආපසු යවන ලදී. |
| 2019.01.15 | රු. 400 000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 600 000 කට සිරිමල්ට අත්පිට මුදලට විකුණන ලදී. |
| 2019.01.24 | රු. 5 000 ක වට්ටමකට යටත්ව ජයමාල් වෙළෙඳුන්ට ගෙවිය යුතු මුදල පියවන ලදී. |

**3.** ජයමාල් වෙළෙඳුන් සමග සිදු කළ ඉහත ගනුදෙනු ඒවා සිදු වූ අනුපිළිවෙළ අනුව සඳුන්ගේ ව්‍යාපාරයේ පොත්වල සටහන් කිරීමට භාවිත කළ මූලාශ්‍ර ලේඛන:
(1) ඉන්වොයිසිය, හරපත, ගෙවීම් වවුචරය
(2) ඉන්වොයිසිය, බැරපත, ගෙවීම් වවුචරය
(3) ඉන්වොයිසිය, ජර්නල් වවුචරය, ගෙවීම් වවුචරය
(4) ඉන්වොයිසිය, හරපත, ලදුපත, ගෙවීම් වවුචරය
(5) ඉන්වොයිසිය, බැරපත, ලදුපත, ජර්නල් වවුචරය (......)

[දෙවැනි පිටුව බලන්න.

**4.** සඳුන්ගේ ව්‍යාපාරයේ **2019.01.12** සිට **2019.01.24** දක්වා සිදු වූ ගනුදෙනු සටහන් කිරීමට භාවිත කළ මූලික සටහන් පොත් අනුපිළිවෙළින්:
(1) ආපසු යැවුම් ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය
(2) ආපසු යැවුම් ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය
(3) පොදු ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය
(4) ගැනුම් ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය
(5) ගැනුම් ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය (……)

**5.** සඳුන්ගේ ව්‍යාපාරයේ 2019 ජනවාරි මාසය සඳහා ලාභය සහ 2019.01.31 දිනට මුදල් ශේෂය කොපමණ ද?

| | **මාසය සඳහා ලාභය (රු.' 000)** | **මුදල් ශේෂය (රු.' 000)** |
|---|---|---|
| (1) | 200 | 155 |
| (2) | 200 | 905 |
| (3) | 205 | 155 |
| (4) | 205 | 900 |
| (5) | 205 | 905 |

(……)

● **අංක 6 සහ 7 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

පහත තොරතුරු සමන්ගේ ව්‍යාපාරයේ 2019 මාර්තු මාසයේ වැටුප් ලේඛනයෙන් උපුටා ගන්නා ලදී. මෙම ව්‍යාපාරය 2019.03.01 දින ආරම්භ කරන ලදී.

| **විස්තරය** | **රු.'000** |
|---|---|
| දළ වැටුප | 500 |
| අඩු කළා : සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේවක දායකය - 10% | 50 |
| ශුද්ධ වැටුප | 450 |
| EPF සඳහා සේව්‍ය දායකය - 15% | 75 |
| සේවක භාරකාර අරමුදලට (ETF) සේව්‍ය දායකය - 3% | 15 |

කිසියම් මාසයක EPF හා ETF ඊළඟ මාසයේ 10 වන දින ප්‍රේෂණය කරනු ලබන අතර ශුද්ධ වැටුප එම මාසය තුළම ගෙවනු ලබයි.

**6.** සමන්ගේ ව්‍යාපාරයේ 2019.03.31 දිනට ඉහත ගනුදෙනුවල **බලපෑම** පහත කුමන ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්වනු ලබයි ද?

| | **වත්කම් (රු.'000)** | = | **වගකීම් (රු.'000)** | + | **හිමිකම් (රු.'000)** |
|---|---|---|---|---|---|
| (1) | – 450 | | + 50 | | – 500 |
| (2) | – 450 | | + 140 | | – 590 |
| (3) | – 500 | | – | | – 500 |
| (4) | – 500 | | + 90 | | – 590 |
| (5) | – 500 | | + 140 | | – 640 |

(……)

**7.** 2019.03.31 දිනෙන් අවසන් මාසය සඳහා EPF වියදම් සහ 2019.03.31 දිනට EPF වගකීම සටහන් කිරීම සඳහා **නිවැරදි** ද්විත්ව සටහන කුමක් ද?

| | | **හර (රු.'000)** | **බැර (රු.'000)** |
|---|---|---|---|
| (1) | EPF වියදම් | 50 | |
| | ගෙවිය යුතු EPF | | 50 |
| (2) | EPF වියදම් | 75 | |
| | ගෙවිය යුතු EPF | | 75 |
| (3) | EPF වියදම් | 125 | |
| | ගෙවිය යුතු EPF | | 125 |
| (4) | EPF වියදම් | 50 | |
| | වැටුප් වියදම් | 75 | |
| | ගෙවිය යුතු EPF | | 125 |
| (5) | EPF වියදම් | 75 | |
| | වැටුප් වියදම් | 50 | |
| | ගෙවිය යුතු EPF | | 125 |

(……)

43802



**8.** ව්‍යාපාරයක ගිණුම්කරණ සංකල්ප භාවිතය සම්බන්ධයෙන් පහත දැක්වෙන කුමන ප්‍රකාශය **සත්‍ය** වන්නේ ද?

(1) සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවන ලද ලාභාංශ, රඳවාගත් ඉපැයුම්වලින් අඩු කර පෙන්වීම සඳහා පදනම සපයනු ලබන්නේ ඒකක සංකල්පයෙනි.
(2) ලැබිය යුතු ආදායම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කමක් ලෙස වර්ග කිරීම සඳහා පදනම සපයනු ලබන්නේ ප්‍රමාණාත්මක සංකල්පයෙනි.
(3) ණයහිමියන්ගෙන් ලද වට්ටම් ආදායමක් ලෙස හඳුනාගැනීම සඳහා පදනම සපයනු ලබන්නේ ගැළපුම් සංකල්පයෙනි.
(4) ණයගැතියන්ට දුන් වට්ටම් වියදමක් ලෙස හඳුනාගැනීම සඳහා පදනම සපයනු ලබන්නේ උපලබ්ධි සංකල්පයෙනි.
(5) අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වගකීමක් ලෙස හඳුනා ගැනීම සඳහා පදනම සපයනු ලබන්නේ විචක්ෂණ සංකල්පයෙනි. (......)

**9.** පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට, මූල්‍ය ප්‍රකාශන තුළ තොගය හඳුනාගැනීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්ප පදනම සපයනු ලබයි ද?

(1) ප්‍රමාණාත්මක සහ ගැළපුම් (2) ගැළපුම් සහ කාලච්ඡේද (3) විචක්ෂණ සහ උපලබ්ධි
(4) විචක්ෂණ සහ ඓතිහාසික පිරිවැය (5) විචක්ෂණ සහ ගැළපුම් (......)

**10.** 2019.03.31 දින ආයතනයක සම්පූර්ණ තොගයම එහි ගබඩාවේ ඇති වූ ගින්නකින් විනාශ විය. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

| | රු.' 000 |
|---|---|
| 2018.04.01 දිනට තොගය - පිරිවැයට | 750 |
| ගැනුම් | 1 750 |
| ආපසු යැවුම් | 250 |
| විකුණුම් | 2 400 |
| විකුණුම් වියදම් | 300 |

ආයතනය පිරිවැය මත 20% ක ලාභ ආන්තිකයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි.

2019.03.31 දිනට පැවැති තොගයේ පිරිවැයෙන් 80% ක් ගෙවීමට රක්ෂණ සමාගම එකඟ වී ඇත.

2019.03.31 දින විනාශ වූ තොගයේ පිරිවැය සහ 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් තොග හානි අලාභය කොපමණ ද?

| | **විනාශ වූ තොගයේ පිරිවැය (රු.'000)** | **තොග හානි අලාභය (රු.'000)** |
|---|---|---|
| (1) | 250 | 50 |
| (2) | 250 | 200 |
| (3) | 330 | 66 |
| (4) | 500 | 100 |
| (5) | 500 | 400 |

(......)

● **අංක 11 සහ 12 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා චතුරිකා ට්‍රේඩර්ස්හි කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

| | රු.' 000 |
|---|---|
| දළ ලාභය | 850 |
| පරිපාලන වියදම් | 275 |
| බෙදාහැරීමේ වියදම් | 200 |
| මූල්‍ය සහ වෙනත් වියදම් | 100 |

කෙසේ වුව ද කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසුව පහත දැ හෙළිදරව් විය.

- 2019.03.31 දිනට ගෙවිය යුතු කාර්යාල සේවක වැටුප් රු. 30 000 ක් සහ විකුණුම් කොමිස් රු. 20 000 ක් ගිණුම්ගත කර නොමැත.
- ඉදිරියට ගෙවූ ගොඩනැගිලි කුලිය වූ රු. 40 000 ක් පරිපාලන වියදම් ලෙස ඇතුළත් කර ඇත.
- මෝටර් රථ ක්ෂය රු. 50 000 ක් බෙදාහැරීමේ වියදම් තුළ ඇතුළත් කර ඇත. කෙසේ වුව ද මෙම මෝටර් රථ කාර්යාල සේවකයින් සඳහා ප්‍රවාහන පහසුකම් ලබාදීමට භාවිත කෙරේ.

**11.** අදාළ ගැළපීම් කිරීමෙන් පසු, 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **නිවැරදි** පරිපාලන වියදම් සහ බෙදාහැරීමේ වියදම්:

| | **පරිපාලන වියදම් (රු.' 000)** | **බෙදාහැරීමේ වියදම් (රු.' 000)** |
|---|---|---|
| (1) | 265 | 170 |
| (2) | 265 | 220 |
| (3) | 285 | 170 |
| (4) | 315 | 170 |
| (5) | 315 | 220 |

(……)

**12.** අදාළ ගැළපීම් කිරීමෙන් පසු 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය:

(1) රු. 215 000 (2) රු. 225 000 (3) රු. 265 000
(4) රු. 275 000 (5) රු. 285 000 (……)

**13.** 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ව්‍යාපාරයක ප්‍රාථමික පිරිවැය සහ මුළු නිෂ්පාදන පිරිවැය පිළිවෙළින් රු. 900 000 ක් සහ රු. 1 600 000 ක් විය. 2018.03.31 සහ 2019.03.31 දිනයන්ට නිෂ්පාදන පිරිවැයට මිනුම්කරන ලද නොනිමි තොග පිළිවෙළින් රු. 200 000 ක් සහ රු. 330 000 ක් විය.

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය කොපමණ ද?

(1) රු. 570 000 (2) රු. 700 000 (3) රු. 830 000
(4) රු. 900 000 (5) රු. 1 030 000 (……)

**14.** සුභසාධක සමිතියක 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ සිටි සාමාජික සංඛ්‍යාව 150 කි. සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 2 000 ක් වේ. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී සමිතියට ලද මුදල් පහත පරිදි වේ.

- ප්‍රවර්තන වර්ෂය සඳහා සාමාජික මුදල් රු. 200 000
- පරිත්‍යාග රු. 250 000
- 2018.03.31 දින කල්පිරුණු ස්ථාවර තැන්පතුවෙන් ලද මුදල් රු. 560 000 (මෙයින් රු. 60 000 ක් පොලී ආදායම වන අතර එය 2018.03.31 දිනට ලැබිය යුතු පොලී ආදායම ලෙස හඳුනාගෙන තිබුණි.)

පරිත්‍යාග එය ලද වසරේ සිට වසර 5 ක් තුළ සමාන වටිනාකම්වලින් ආදායමක් ලෙස හඳුනාගැනීම සමිතියේ ප්‍රතිපත්තිය වේ.

ඉහත ගනුදෙනු නිසා 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත් ආදායම සහ 2019.03.31 දිනට වත්කම්වල වැඩි වීම:

| | **හඳුනාගත් ආදායම (රු.'000)** | **වත්කම්වල වැඩිවීම (රු.'000)** |
|---|---|---|
| (1) | 310 | 1 110 |
| (2) | 350 | 550 |
| (3) | 350 | 610 |
| (4) | 410 | 550 |
| (5) | 410 | 610 |

(……)

**15.** පහත කුමන ප්‍රකාශ හවුල් ව්‍යාපාරයකට අදාළව **නිවැරදි** වේ ද?

A - හවුල් ව්‍යාපාරයක ලාභාලාභ අනුපාතය වෙනස් වූ විට එහි කීර්තිනාමය ඇස්තමේන්තු කරනු ලබයි.
B - 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 42 වන වගන්තියට අනුව හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය ඇස්තමේන්තු කරනු ලබයි.
C - 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අනුව හවුල්කරුවන් වේතන සඳහා හිමිකම් නොලබයි.
D - හවුල්කරුවන් විසින් හවුල් ව්‍යාපාරයක ලාභය ඉවත් කර ගැනීමේ ක්‍රමයක් ලෙස 'ගැනිලි' භාවිත කළ හැක.
E - 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අනුව හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ශේෂ මත 5% ක පොලියක් ගෙවිය යුතු වේ.

(1) A, B හා C පමණි. (2) A, C හා D පමණි. (3) B, D හා E පමණි.
(4) C, D හා E පමණි. (5) A, C, D හා E පමණි. (……)

- **අංක 16 සහ 17 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

මධු, නිලූ සහ රාජු පිළිවෙළින් 3 : 2 : 1 අනුපාතයට ලාභාලාභ බෙදා ගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලදී. 2018.04.01 දිනට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් ශේෂ පහත පරිදි විය:

| | **මධු (රු.'000)** | **නිලූ (රු.'000)** | **රාජු (රු.'000)** |
|---|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම් | 3 000 | 2 000 | 1 000 |
| ජංගම ගිණුම් | 400 | 200 | 100 |

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය රු. 600 000 ක ලාභයක් උපයන ලදී. 2019.03.31 දින රාජු හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගත් අතර එදිනට ඔහුට ගෙවිය යුතු මුළු මුදල වූ රු. 1 500 000, ණය ගිණුමකට මාරු කරන ලදී. මධු සහ නිලූ පිළිවෙළින් 2 : 1 අනුපාතයට ලාභාලාභ බෙදාගනිමින් මෙදින සිට හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යන ලදී. හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගළපනු ලබන අතර හවුල් ව්‍යාපාරයේ කීර්තිනාම ගිණුමක් පවත්වාගනු නොලැබේ.

**16.** 2019.03.31 දිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමයේ වටිනාකම කොපමණ ද?

(1) රු. 300 000 (2) රු. 400 000 (3) රු. 500 000
(4) රු.1 500 000 (5) රු. 1 800 000 (......)

**17.** කීර්තිනාමය ගැළපීම නිසා 2019.03.31 දිනට මධු සහ නිලූගේ ප්‍රාග්ධන ගිණුම්වල ශේෂයන්ට ඇති වූ **ශුද්ධ බලපෑම** කොපමණ ද?

| | **මධු** | **නිලූ** |
|---|---|---|
| (1) | බලපෑමක් නොවේ. | බලපෑමක් නොවේ. |
| (2) | බලපෑමක් නොවේ. | රු. 300 000 කින් වැඩි වේ. |
| (3) | රු. 300 000 කින් අඩු වේ. | බලපෑමක් නොවේ. |
| (4) | රු. 300 000 කින් අඩු වේ. | රු. 300 000 කින් වැඩි වේ. |
| (5) | රු. 300 000 කින් වැඩි වේ. | රු. 300 000 කින් අඩු වේ. |

(......)

**18.** LKAS 8 (ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි) ප්‍රමිතයට අනුව පහත දැක්වෙන කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී සහ ඉදිරිපත් කිරීමේ දී භාවිත කරනු ලබන විශේෂිත මූලධර්ම, පදනම්, සම්ප්‍රදායන්, රීතීන් සහ පරිචයන් ගිණුම්කරණ ප්‍රතිපත්ති නම් වේ.
B - ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම්, නව තොරතුරු හෝ නව ප්‍රවණතා හේතු කොට ගෙන ඇති වේ.
C - අතීත කාලච්ඡේද වැරදි අතීතයානුයෝගී ලෙස නිවැරදි කරනු ලබන්නේ එම වැරදි මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග මැනීම සම්බන්ධව ඇති වූ විට පමණි.

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම. (......)

**19.** LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව පහත දැක්වෙන කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - ක්ෂයවීම යනු වත්කමක ක්ෂය කළ හැකි වටිනාකම එහි ඵලදායී ජීව කාලය තුළ ක්‍රමානුකූලව බෙදාහැරීමයි.
B - ක්ෂය කළ හැකි වටිනාකම යනු වත්කමක පිරිවැය හෝ පිරිවැය සඳහා ආදේශ කළ වෙනත් අගයකින් සුන්බුන් අගය අඩු කළ විට ලැබෙන වටිනාකමයි.
C - ඵලදායී ජීව කාලය යනු, ආයතනයක් විසින් වත්කමක් භාවිත කිරීම සඳහා පවතී යැයි අපේක්ෂා කරන කාල සීමාවයි.

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම. (......)

**20.** 2019.03.01 දින සීමිත නෙතු පොදු සමාගම රු. 2 000 000 ක් ගෙවා නිෂ්පාදන කටයුතු සඳහා භාවිත කිරීමට යන්ත්‍රයක් ආනයනය කරන ලදී. සමාගම විසින් මේ සඳහා පහත වියදම් ද දරන ලදී.

| | **රු.' 000** |
|---|---|
| වැඩබිම සකස් කිරීම | 160 |
| යන්ත්‍රයට විදුලි සැපයුම සම්බන්ධ කිරීමේ ගාස්තු | 10 |
| මූලික පර්යේෂණ ධාවනයේ පිරිවැය | 20 |
| භාණ්ඩයේ ගුණාත්මකභාවය පිළිබඳ ප්‍රචාරණ වියදම | 60 |
| යන්ත්‍රය භාවිත කිරීම ආරම්භ කිරීමට අනුමැතිය ලබාගැනීම සඳහා ගෙවූ බලපත්‍ර ගාස්තු | 30 |
| යන්ත්‍රය භාවිතය ආරම්භ කිරීමේ සමාරම්භක උත්සවයේ පිරිවැය | 40 |

LKAS 16 (දේපළ, පිරියත සහ උපකරණ) ප්‍රමිතයට අනුව හඳුනාගැනීමේ දී යන්ත්‍රයේ පිරිවැය කොපමණ ද?

(1) රු. 2 160 000 (2) රු. 2 180 000 (3) රු. 2 210 000
(4) රු. 2 220 000 (5) රු. 2 260 000 (......)

[ශයවැනි පිටුව බලන්න.

**21.** 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත තාරක පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2019.06.20 දින අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලදී. 2019.03.31 සහ 2019.06.20 අතර කාලය තුළ පහත සිද්ධීන් සමාගමේ සිදු වී තිබුණි.

A - 2019.03.31 දිනට රු. 500 000 ක් ගෙවිය යුතු වෙළෙඳ ණයගැතියකු 2019.05.28 දින බුන්වත් වූ බව ප්‍රකාශයට පත් කරන ලදී.

B - 2019.03.31 දිනට පැවැති ලැයිස්තුගත පොදු සමාගම්වල කොටස් ආයෝජන වටිනාකම 2019.06.20 දින වන විට රු. 1 000 000 කින් පහළ ගොස් ඇත.

C - 2019.04.05 දින සමාගමට විරුද්ධව පවරන ලද නඩුවක තීන්දුව 2019.06.01 දින ලබා දුන් අතර රු. 4 000 000 ක දඩයක් රජය වෙත ගෙවීමට නියම කරන ලදී.

LKAS 10 (වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්) ප්‍රමිතයට අනුව ඉහත කුමන සිදුවීම/සිදුවීම් 2019.03.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගැළපිය යුතු ද?

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) A හා C පමණි. (5) B හා C පමණි. (......)

**22.** LKAS 2 (තොග) ප්‍රමිතයට අනුව තොගයේ පිරිවැය තීරණය කිරීමේ දී පහත කුමන පිරිවැය අයිතමය/අයිතම ඇතුළත් කරනු **නොලබයි ද**?

A - අමුද්‍රව්‍ය, ශ්‍රමය හෝ වෙනත් නිෂ්පාදන පිරිවැයට අදාළව අපතේ යන ලද අසාමාන්‍ය වටිනාකම්
B - නිෂ්පාදිත භාණ්ඩ ගනුදෙනුකරුවන්ට බෙදාහරින තෙක් දරනු ලබන ගබඩා පිරිවැය
C - ප්‍රදර්ශනාගාරවල පරිපාලන පොදුකාර්ය පිරිවැය

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම. (......)

● **අංක 23 සහ 24 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සීමිත සාරංග පොදු සමාගමට අදාළ වේ.

| **විස්තරය** | **රු.' 000** |
|---|---|
| පිරිවැටුම | 950 |
| දළ ලාභය | 450 |
| පරිපාලන සහ බෙදාහැරීමේ වියදම් | 250 |
| ඉඩම් ප්‍රත්‍යාගණන අතිරික්තය | 150 |
| මෝටර් රථ ප්‍රත්‍යාගණන අතිරික්තය | 75 |

වර්ෂය තුළ දී ඉඩම් ප්‍රථම වරට ද මෝටර් රථ දෙවන වරට ද ප්‍රත්‍යාගණනය කරන ලදී. 2017.03.31 දින ප්‍රථම වරට මෝටර් රථ ප්‍රත්‍යාගණනය කිරීම තුළින් රු. 35 000 ක හිඟයක් ඇති විය. සමාගම සම්පූර්ණයෙන්ම හිමිකම් මගින් මූල්‍යනය කර ඇති අතර ආදායම් බදුවලින් නිදහස් ය.

**23.** 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගම විසින් හඳුනාගත් මුළු ආදායම සහ මුළු වියදම:

| | **මුළු ආදායම (රු.' 000)** | **මුළු වියදම (රු.' 000)** |
|---|---|---|
| (1) | 1 140 | 700 |
| (2) | 1 140 | 750 |
| (3) | 1 175 | 700 |
| (4) | 1 175 | 750 |
| (5) | 1 175 | 785 |

(......)

**24.** 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ ලාභය සහ වෙනත් විස්තීරණ ආදායම:

| | **වර්ෂය සඳහා ලාභය (රු.' 000)** | **වෙනත් විස්තීරණ ආදායම (රු.' 000)** |
|---|---|---|
| (1) | 165 | 225 |
| (2) | 200 | 225 |
| (3) | 200 | 190 |
| (4) | 235 | 190 |
| (5) | 235 | 225 |

(......)

**25.** පහත තොරතුරු 2019.03.31 දිනට සමාගමකට අදාළ වේ.

| | |
|---|---|
| ජංගම අනුපාතය | වාර 2 |
| ජංගම වගකීම් | රු. 60 000 |
| තොගය | රු. 48 000 |

2018.04.01 දිනට තොගය රු. 32 000 ක් විය. තවද 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් රු. 300 000 ක් වූ අතර එහි දළ ලාභ අනුපාතය 20% ක් විය.

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තොග පිරිවැටුම් අනුපාතය සහ 2019.03.31 දිනට ක්ෂණික වත්කම් අනුපාතය:

| | **තොග පිරිවැටුම් අනුපාතය (වාර)** | **ක්ෂණික වත්කම් අනුපාතය (වාර)** |
|---|---|---|
| (1) | 5 | 1.2 |
| (2) | 6 | 1.33 |
| (3) | 6 | 1.2 |
| (4) | 6.25 | 1.33 |
| (5) | 7.5 | 1.2 |

(……)

**26.** සීමිත සමන් පොදු සමාගමේ 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගණනය කළ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය 20% ක් විය. කෙසේ වුව ද 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පහත ගනුදෙනු සැලකිල්ලට ගෙන නොමැත

A - ගොඩනැගිලි ප්‍රථම වරට ප්‍රත්‍යාගණනය කිරීම තුළින් ඇති වූ රු. 500 000 ක අතිරික්තය

B - රු. 800 000 ක සංචිත ප්‍රාග්ධනීත කිරීම

C - රු. 200 000 ක ආපසු යැවුම්

ඉහත සඳහන් කුමන ගනුදෙනුව/ගනුදෙනු නිසා සමාගමේ හිමිකම මත ප්‍රතිලාභ අනුපාතයේ **වැඩිවීමක්** සිදුවන්නේ ද?

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා B පමණි. (5) B හා C පමණි. (……)

**27.** සීමිත අමල් පොදු සමාගම භාණ්ඩයකින් ඒකක 50 000 ක් වාර්ෂිකව නිෂ්පාදනය කර විකුණනු ලබයි. ඒකකයක ප්‍රාථමික පිරිවැය රු. 20 ක් වන අතර එය විචල්‍ය පිරිවැයෙන් පමණක් සමන්විත වේ. ඒකක 50 000 ක ක්‍රියාකාරී මට්ටමේ දී නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය සහ නිෂ්පාදන නොවන පොදු කාර්ය පිරිවැය පිළිවෙළින් රු. 2 000 000 ක් සහ රු. 1 500 000 ක් වේ. සමාගමේ ස්ථාවර පිරිවැය මුළු පොදු කාර්ය පිරිවැයෙන් 60% ක් වේ.

මෙම භාණ්ඩයේ ඒකකයක මුළු පිරිවැය හා ඒකකයක විචල්‍ය පිරිවැය කොපමණ ද?

| | **ඒකකයක මුළු පිරිවැය (රු.)** | **ඒකකයක විචල්‍ය පිරිවැය (රු.)** |
|---|---|---|
| (1) | 36 | 30 |
| (2) | 70 | 48 |
| (3) | 90 | 30 |
| (4) | 90 | 40 |
| (5) | 90 | 48 |

(……)

**28.** තනි භාණ්ඩයක් නිෂ්පාදනය කරනු ලබන සමාගමක 'X' සහ 'Y' යන නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් ඇත. මෙම නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක සඳහා පහත තොරතුරු අදාළ වේ.

| **නිෂ්පාදන දෙපාර්තමේන්තු** | **නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (රු.)** | **අවශ්‍ය පැය ගණන** |
|---|---|---|
| X | 200 000 | යන්ත්‍ර පැය 10 000 |
| Y | 150 000 | ශ්‍රම පැය 30 000 |

මෙම භාණ්ඩ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා රු. 50 ක් වූ සෘජු අමුද්‍රව්‍යය ද පැයකට රු. 50 ක් ලෙස සෘජු ශ්‍රමය පැය 4 ක් ද අවශ්‍ය වේ. මෙම භාණ්ඩ ඒකකයක මුළු නිෂ්පාදන පිරිවැය ගණනය කිරීමේ දී යන්ත්‍ර පැය 2 ක් සහ ශ්‍රම පැය 4 ක් සඳහා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කෙරේ.

භාණ්ඩ ඒකකයක් සඳහා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය සහ නිෂ්පාදන පිරිවැය:

| | **ඒකකයක නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (රු.)** | **ඒකකයක නිෂ්පාදන පිරිවැය (රු.)** |
|---|---|---|
| (1) | 20 | 270 |
| (2) | 25 | 310 |
| (3) | 40 | 290 |
| (4) | 60 | 310 |
| (5) | 60 | 350 |

(……)

**29.** සමච්ඡේදන ලක්ෂ්‍යයේ දී පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - මුළු දායකය මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ.

B - මුළු විකුණුම් ආදායම මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ.

C - මුළු ස්ථාවර පිරිවැයෙහි සහ මුළු විචල්‍ය පිරිවැයෙහි එකතුව මුළු විකුණුම් ආදායමට සමාන වේ.

D - ඒකකයක ස්ථාවර පිරිවැය ඒකකයක විචල්‍ය පිරිවැයට සමාන වේ.

(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A, B හා D පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (……)

**30.** ව්‍යාපෘතියක ශුද්ධ වර්තමාන අගය රු. 800 000 කි. අනෙකුත් සාධක නොවෙනස්ව තිබිය දී පහත කුමන සාධක මෙම ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය **අඩුවීමට** බලපායි ද?

A - වට්ටම් අනුපාතය අඩු වීම

B - ආරම්භක ආයෝජනය වැඩි වීම

C - ශුද්ධ මෙහෙයුම් මුදල් ගලා ඒම් අඩු වීම

D - ව්‍යාපෘති වාර්තාව පිළියෙල කිරීමේ පිරිවැය වැඩි වීම

(1) A හා C පමණි. (2) B හා C පමණි. (3) A, B හා C පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම. (……)

…… × 4 = ලකුණු ……….

● අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු තිත් ඉර මත ලියන්න.

**31.** ව්‍යාපාරයක කළමනාකරණ ගිණුම්කරණයෙහි කාර්යභාරය සම්බන්ධයෙන් පහත ප්‍රකාශ **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **සත්‍ය/අසත්‍ය** |
|---|---|
| A - කළමනාකරුවන්ගේ භාවිතය සඳහා පොදු පරමාර්ථ මූල්‍ය වාර්තා පිළියෙල කරයි. | ……………… |
| B - ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය වාර්තා පිළියෙල කරයි. | ……………… |
| C - ව්‍යාපාරයක අතීත මෙන්ම අනාගත තොරතුරු සපයයි. | ……………… |
| D - ව්‍යාපාරයක කළමනාකරුවන්ගේ ඉල්ලීම මත තොරතුරු ජනනය කරයි. | ……………… |

**32.** ව්‍යාපාරයක පහත ගනුදෙනු එහි හිමිකම **වැඩිවීමට** හේතු වන්නේ ද යන්න සඳහන් කරන්න.
(වැඩි වන්නේ නම් '✓' ලකුණ ද වැඩි නොවන්නේ නම් 'X' ලකුණ ද දක්වන්න.)

| **ගනුදෙනුව** | **හිමිකමෙහි වැඩිවීම** |
|---|---|
| A - පිරිවැය රු. 50 000 ක් වූ භාණ්ඩ රු. 80 000 කට ණයට විකුණන ලදී. | ……………… |
| B - අයිතිකරු විසින් රු. 200 000 ක් වටිනා උපකරණයක් ව්‍යාපාරයට සපයන ලදී. | ……………… |
| C - අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික මුදලින් රු. 30 000 ක් වූ ව්‍යාපාරයේ ණය වාරිකයක් ගෙවන ලදී. | ……………… |
| D - ණයහිමියකු පියවීමේ දී රු. 5 000 ක මුදල් වට්ටමක් ලැබුණි. | ……………… |

**33.** පහත එක් එක් ප්‍රකාශය මගින් විස්තර කරනු ලබන **වඩාත්** උචිත ගිණුම් වාර්තාව සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | ගිණුම් වාර්තාව |
|---|---|
| A - නිශ්චිත දිනකට ශේෂ සහිත සම්පූර්ණ ගිණුම් ලැයිස්තුව | …………………… |
| B - ආයතනයක ගිණුම් සමූහය ඇතුළත් ලේඛනය | …………………… |
| C - තොග අයිතමයක ශේෂය වෙනස්වීම් සටහන් කරනු ලබන ලේඛනය | …………………… |
| D - කිසියම් වර්ගයක ගනුදෙනු දින අනුපිළිවෙළට සටහන් කරනු ලබන ගිණුම් පොත | …………………… |

[නවවැනි පිටුව බලන්න.

**34.** 2019.03.31 දිනට ව්‍යාපාරයක ශේෂ පිරික්සුම තුලනය නොවූ අතර එම වෙනස අවිනිශ්චිත ගිණුමකට මාරු කරන ලදී. පසුව කරන ලද විමර්ශනයේ දී පහත වැරදි අනාවරණය විය.

A - 2019 මාර්තු මාසය සඳහා විකුණුම් ජර්නලයේ එකතුව වූ රු. 540 000, ණයගැති පාලන ගිණුමට සහ විකුණුම් ගිණුමට රු. 450 000 ක් ලෙස පිටපත් කර තිබුණි.

B - ණයගැතියන්ට ලබාදුන් රු. 10 000 ක වට්ටම්, දුන් වට්ටම් ගිණුමට රු. 1 000 ක් ලෙස හර කර තිබුණි. කෙසේ වුව ද මෙම වටිනාකම නිවැරදිව ණයගැති පාලන ගිණුමට පිටපත් කර තිබුණි.

ඉහත වැරදි නිවැරදි කිරීම සඳහා ජර්නල් සටහන් ලියන්න. (සංලක්ෂ්‍ය අවශ්‍ය නොවේ.)

| **වැරැද්ද** | **විස්තරය** | **හර (රු.)** | **බැර (රු.)** |
|---|---|---|---|
| A | ............................................<br>............................................ | .................... | <br>.................... |
| B | ............................................<br>............................................ | .................... | <br>.................... |

**35.** පහත ගිණුම්කරණ පිළිවෙත්වලට අදාළ **වඩාත්** උචිත ගිණුම්කරණ සංකල්පය සඳහන් කරන්න.

| **ගිණුම්කරණ පිළිවෙත** | **ගිණුම්කරණ සංකල්පය** |
|---|---|
| A - විකුණු භාණ්ඩ සඳහා ලබාදුන් වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනයක් කිරීම. | .................... |
| B - කල්බදු ක්‍රමයට ගත් ගොඩනැගිල්ලක් කල්බදු ගැනුම්කරුගේ පොත්වල වත්කමක් ලෙස සටහන් කිරීම. | .................... |
| C - ක්ෂය, ලාභාලාභ ගිණුම තුළ වියදමක් ලෙස හඳුනාගැනීම. | .................... |
| D - වත්කම්, ජංගම සහ ජංගම නොවන ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කිරීම. | .................... |

**36.** තනි පුද්ගල වෙළෙඳ ව්‍යාපාරයකට අදාළව පහත ප්‍රකාශන **සත්‍ය** ද (**T**) **අසත්‍ය** ද (**F**) යන්න සඳහන් කරන්න.

| **ප්‍රකාශය** | **සත්‍ය/අසත්‍ය** |
|---|---|
| A - ප්‍රාග්ධන ආයෝජනය සහ රඳවාගත් ඉපැයුම්වල එකතුව හිමිකමට සමාන වේ. | .................... |
| B - ආදායම් ප්‍රකාශනය උපචිත පදනම මත පිළියෙල නොකරයි. | .................... |
| C - ගැනිලි, ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. | .................... |
| D - අයිතිකරු විසින් ව්‍යාපාරය මෙහෙයවන නිසා කළමනාකරණ ගිණුම්කරණ වාර්තා පිළියෙල කිරීම ප්‍රයෝජනවත් නොවේ. | .................... |

**37.** පහත තොරතුරු තනි පුද්ගල ව්‍යාපාරයක් වන අමාලි ට්‍රේඩර්ස් සඳහා 2019.03.31 දිනට සපයා ඇත.

| | **රු.** |
|---|---|
| මුළු වත්කම් | 2 750 000 |
| මුළු වගකීම් | 1 650 000 |

මෙම ව්‍යාපාරයේ 2018.03.31 දිනට හිමිකම රු. 800 000 ක් විය.

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී අයිතිකරු ව්‍යාපාරයෙන් රු. 250 000 ක් ගැනිලි ලෙස ලබාගත් අතර රු. 450 000 ක් අතිරේක ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරන ලදී.

පහත දෑ සඳහන් කරන්න:

(අ) 2019.03.31 දිනට හිමිකම : රු. ............................

(ආ) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය : රු. ............................

● **අංක 38 සහ 39 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ආනන්ද සහ ජයන්ත විසින් ලිඛිත ගිවිසුමක් නොමැතිව හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලදි. 2018.04.01 දින හවුල් ව්‍යාපාරයේ මෝටර් රථවල රක්ෂණ වාරිකය සඳහා රු. 250 000 ක් ආනන්ද විසින් ඔහුගේ පෞද්ගලික මුදල් භාවිත කරමින් ගෙවන ලදි. කෙසේ වුව ද 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මෙය ගළපා නොතිබූ අතර හවුල් ව්‍යාපාරය රු. 562 500 ක ලාභයක් වාර්තා කර තිබුණි. මෙම මුදල ආනන්ද විසින් හවුල් ව්‍යාපාරයට ලබා දුන් ණය මුදලක් ලෙස හඳුනාගැනීමට පසුව තීරණය කරන ලදි.

**38.** ආනන්ද විසින් ගෙවූ හවුල් ව්‍යාපාරයේ රක්ෂණ වාරිකය ණය මුදලක් ලෙස හඳුනාගැනීම සහ 2019.03.31 දිනට එම ණය මත ගෙවිය යුතු පොලිය හඳුනාගැනීමට ජර්නල් සටහන් ලියන්න.

| **විස්තරය** | **හර (රු.)** | **බැර (රු.)** |
|---|---|---|
| (අ) ........................................................<br>........................................................<br>(ආනන්ද විසින් ගෙවූ හවුල් ව්‍යාපාරයේ රක්ෂණ වාරිකය) | ...................... | ...................... |
| (ආ) ........................................................<br>........................................................<br>(ආනන්ද විසින් ලබා දුන් ණය මත ගෙවිය යුතු පොලිය) | ...................... | ...................... |

**39.** පහත දෑ සඳහන් කරන්න:

(අ) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සංශෝධිත ලාභය : රු. ..............................

(ආ) සංශෝධිත ලාභය මත ආනන්දගේ ලාභ කොටස : රු. ..............................

**40.** මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පනාත්මක රාමුවට අනුව ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක බව වැඩිදියුණු කිරීමේ ගතිලක්ෂණ **හතර** සඳහන් කරන්න.

(1) ........................................ (2) ........................................

(3) ........................................ (4) ........................................

**41.** සීමිත මානෙල් පොදු සමාගම 2015.04.01 දින රු. 1 000 000 කට යන්ත්‍රයක් මිල දී ගන්නා ලදී. මෙදිනට එහි ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 5 ක් සහ රු.100 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 2018.04.01 දින රු. 280 000 ක පිරිවැයක් දරමින් මෙම යන්ත්‍රයේ ප්‍රධාන උපාංගයක් නවීකරණය කරන ලදී. මෙදින යන්ත්‍රයේ ඉතිරි ඵලදායී ජීව කාලය වසර 4 ක් ලෙස ද සුන්බුන් අගය රු. 180 000 ක් ලෙස ද නැවත ඇස්තමේන්තු කරන ලදී.

පහත දෑ ගණනය කරන්න:

(අ) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ක්ෂයවීම් : රු. ..............................

(ආ) 2019.03.31 දිනට යන්ත්‍රයේ ධාරණ වටිනාකම : රු. ..............................

**42.** LKAS 37 (ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්) ප්‍රමිතයට අනුව ප්‍රතිපාදනවල සහ වෙනත් වගකීම්වල ලක්ෂණයන්හි ස්වරූපය දැක්වීම සඳහා පහත වරහන් තුළ දක්වා ඇති **නිවැරදි** යෙදුම තෝරන්න.

| **ලක්ෂණ** | **ප්‍රතිපාදන** | **වෙනත් වගකීම්** |
|---|---|---|
| A- වර්තමාන බැඳීමක් පැවතීම (**ඔව්/නැත**) | ...................... | ...................... |
| B- පියවීමේ දී ගෙවිය යුතු වටිනාකම (**නිශ්චිතය/අවිනිශ්චිතය**) | ...................... | ...................... |
| C- පියවීමේ කාලය (**නිශ්චිතය/අවිනිශ්චිතය**) | ...................... | ...................... |

**43.** SLFRS 16 (ගනුදෙනුකරුවන් සමග ගිවිසුම්වලින් ආයභාරය) ප්‍රමිතයට අනුව පහත දෑ සඳහන් කරන්න.

(අ) ආයතනයක ආයභාරය හඳුනාගත යුතු අවස්ථාව:

..........................................................................................

..........................................................................................

[එකොළොස්වැනි පිටුව බලන්න.

(ආ) 'ගනුදෙනුවක මිල' යන්නෙහි නිර්වචනය:

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

**44.** සීමිත නිලු පොදු සමාගමේ 2018.04.01 දිනට පහත ශේෂ පැවතුණි.

| | රු.' 000 |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 100 000) | 2 000 |
| රඳවාගත් ඉපැයුම් | 800 |

2018.09.30 දින සමාගම කොටසක් රු. 20 ක ප්‍රතිෂ්ඨාවකට රු. 400 000 ක රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරන ලදී. 2018.12.31 දිනට පැවැති සෑම කොටස් 12 කටම 1 බැගින් කොටසක් රු. 10 ක ප්‍රතිෂ්ඨාවකට හිමිකම් නිකුතුවක් එදින සිදු කරන ලදී. දැනට සිටින කොටස් හිමියන් විසින් සියලුම හිමිකම් කොටස් සඳහා දායක වන ලදී. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය රු. 300 000 ක් විය.

පහත දෑ සඳහන් කරන්න:

(අ) ඉහත කොටස් නිකුත් කිරීම් නිසා සිදු වූ මුදල් ශේෂයේ වැඩි වීම : රු. ..........................

(ආ) 2019.03.31 දිනට හිමිකම : රු. ..........................

**45.** ආයතනයක ගිණුම්කරණ අනුපාත විශ්ලේෂණය හා සම්බන්ධව පහත ප්‍රකාශ **සත්‍ය** ද (**T**) **අසත්‍ය** ද (**F**) යන්න සඳහන් කරන්න.

| | **ප්‍රකාශය** | **සත්‍ය/අසත්‍ය** |
|---|---|---|
| A - | ඉහළ තොග පිරිවැටුම් අනුපාතයක් අඩු තොග රැඳවුම් කාලයක් පෙන්නුම් කරයි. | ........................ |
| B - | ණයගැතියන්ගෙන් මුදල් එකතු කර ගැනීම තුළින් ජංගම අනුපාතය අඩු වේ. | ........................ |
| C - | ඉහළ පොලී ආවරණ අනුපාතයක් අඩු ණය ගෙවීමේ හැකියාවක් පෙන්නුම් කරයි. | ........................ |
| D - | වසර අවසාන තොගය ශුද්ධ උපලබ්ධි අගයට මිනුම් කිරීම දළ ලාභ අනුපාතයට බලපෑමක් ඇති කරයි. | ........................ |

**46.** සමාගමක් විසින් අලෙවි කරන භාණ්ඩයකට පහත තොරතුරු අදාළ වේ.

| **දිනය** | **විස්තරය** | |
|---|---|---|
| 2019.07.01 | තොග ශේෂය | (ඒකකයක් රු. 3 බැගින් ඒකක 1 000) |
| 2019.07.05 | ගැනුම් | (ඒකකයක් රු. 4 බැගින් ඒකක 1 500) |
| 2019.07.12 | ගැනුම් | (ඒකකයක් රු. 6 බැගින් ඒකක 500) |
| 2019.07.28 | විකුණුම් | (ඒකකයක් රු. 10 බැගින් ඒකක 2 000) |

පහත දක්වා ඇති එක් එක් මිල කිරීමේ ක්‍රමය යටතේ පහත දෑ ගණනය කරන්න:

| **මිල කිරීමේ ක්‍රමය** | **2019 ජුලි මාසයෙහි විකුණුම් පිරිවැය (රු.)** | **2019.07.31 දිනට අවසාන තොගය (රු.)** |
|---|---|---|
| (අ) පෙර-පිවිසි පෙර-පිට (FIFO) ක්‍රමය | ...................... | ...................... |
| (ආ) බරිත සාමාන්‍ය ක්‍රමය | ...................... | ...................... |

**47.** සමාගමක් තම නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා භාවිත කරනු ලබන අමුද්‍රව්‍යයක යළි ඇණවුම් ප්‍රමාණය තීරණය කිරීම සඳහා ආර්ථික ඇණවුම් ප්‍රමාණ (EOQ) ආකෘතිය භාවිත කරයි. පහත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| වාර්ෂික ඉල්ලුම | ඒකක 40 000 |
| ඒකක 8 000 ක ඇණවුම් ප්‍රමාණයක දී මුළු වාර්ෂික ඇණවුම් පිරිවැය | රු. 5 000 |
| ඒකකයක වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය | රු. 5 |

පහත දෑ ගණනය කරන්න:

(අ) ඇණවුමක ඇණවුම් පිරිවැය : රු. ..........................

(ආ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය : ඒකක ..........................

**48.** සමාගමක් සතුව නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙකක් සහ සේවා දෙපාර්තමේන්තුවක් ඇත. සේවා දෙපාර්තමේන්තුවේ අයවැයගත පොදු කාර්ය පිරිවැය රු. 100 000 ක් වන අතර එය නිෂ්පාදන දෙපාර්තමේන්තු අතර වැඩ කළ යන්ත්‍ර පැය ගණන මත පදනම්ව නැවත බෙදාහරිනු ලැබේ. පහත අතිරේක අයවැයගත තොරතුරු ද දී ඇත.

| | **නිෂ්පාදන දෙපාර්තමේන්තු I** | **නිෂ්පාදන දෙපාර්තමේන්තු II** |
|---|---|---|
| යන්ත්‍ර පැය | 7 000 | 3 000 |
| ඒකකයක නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය | රු. 120 | රු. 140 |
| ඒකකයක සැකසුම් කාලය | යන්ත්‍ර පැය 3 | යන්ත්‍ර පැය 2 |

නිෂ්පාදන දෙපාර්තමේන්තු I සඳහා පහත දෑ දක්වන්න:

(අ) නැවත විභාජනය කරන ලද සේවා දෙපාර්තමේන්තු පොදු කාර්ය පිරිවැය : රු. ......................

(ආ) යන්ත්‍ර පැයකට පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාතය : රු. ......................

නිෂ්පාදන දෙපාර්තමේන්තු II සඳහා පහත දෑ දක්වන්න:

(ඉ) මුළු නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය : රු. ......................

**49.** තරග විභාගයක් වෙනුවෙන් සංවිධානය කරන ලද **පැය 03** ක සම්මන්ත්‍රණයකට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | රු. |
|---|---|
| ශාලා කුලිය (පැයකට) .......................................... | 10 000 |
| දේශක ගාස්තුව (පැයකට)........................................ | 15 000 |
| ප්‍රචාරණ වියදම් .................................................. | 25 000 |
| සහභාගිවන්නෙකු සඳහා දේශන සටහන් වියදම් ............... | 500 |
| සහභාගිවන්නෙකුගෙන් අය කරන සම්මන්ත්‍රණ ගාස්තුව ...... | 1 500 |

පහත දෑ ගණනය කරන්න:

(අ) සහභාගිවන්නෙකුගේ දායකය : රු. ..........................

(ආ) සම්මන්ත්‍රණයේ ස්ථාවර පිරිවැය : රු. ..........................

(ඉ) මුළු පිරිවැය ආවරණය කර ගැනීම සඳහා සහභාගි විය යුතු සංඛ්‍යාව : ..............................

**50.** සමාගමක් නව ව්‍යාපෘතියක භාවිතය සඳහා රු. 900 000 ක් පිරිවැය වූ යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටී. එම යන්ත්‍රයේ ඵලදායී ජීව කාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 5 ක් සහ රු. 100 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත වාර්ෂික ලාභය රු. 200 000 ක් වන අතර එහි මුදල් නොවන එකම වියදම ක්ෂය වියදමයි.

මෙම ව්‍යාපෘතිය සඳහා පහත දෑ ගණනය කරන්න:

(අ) ගිණුම්කරණ ප්‍රතිලාභ අනුපාතය (%) : ..................................

(ආ) පිළිගෙවුම් කාලය (වසර) : ..................................

ලකුණු

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ගිණුම්කරණය II
கணக்கீடு II
Accounting II

33 S II

2019.08.26 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය** ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස් :**
* **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
* අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200** ක් හිමි වේ.

1. සීමිත සනුග පොදු සමාගමේ 2019.03.31 දිනට සාරාංශගත ශේෂ පිරික්සුම පහත දී ඇත.

| **විස්තරය** | **හර (රු. '000)** | **බැර (රු. '000)** |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ | 90 000 | |
| 2018.04.01 දිනට දේපළ, පිරියත සහ උපකරණ මත සමුච්චිත ක්ෂය | | 15 000 |
| විකුණුම් | | 88 000 |
| විකුණුම් පිරිවැය | 45 000 | |
| තොගය | 4 200 | |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 17 300 | |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | | 19 000 |
| කල්බදු ගෙවීම් | 3 750 | |
| මුදල් සහ මුදල් සමාන දෑ | 750 | |
| 2018.04.01 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදන | | 580 |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස් | | 45 500 |
| 2018.04.01 දිනට රඳවාගත් ඉපැයුම් | | 6 395 |
| පරිපාලන වියදම් | 4 500 | |
| බෙදාහැරීමේ පිරිවැය | 5 200 | |
| මූල්‍ය වියදම් | 750 | |
| වෙනත් වියදම් | 1 800 | |
| ආදායම් බදු ගෙවීම් | 1 950 | |
| 2018.04.01 දිනට ආදායම් බදු සඳහා ප්‍රතිපාදන | | 725 |
| | **175 200** | **175 200** |

[ දෙවැනි පිටුව බලන්න.

**අතිරේක තොරතුරු:**

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර පහත දෑ සඳහා ගැළපීම් කළ යුතු වේ.

(i) පරිපාලන වියදම් තුළ රු. 900 000 ක අධ්‍යක්ෂ ගාස්තු ඇතුළත් වේ. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණන ගාස්තුව රු. 250 000 ක් වූ අතර එය වර්ෂය අවසන් වන විට ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොමැත.

(ii) සමාගමට එරෙහිව ගනුදෙනුකරුවකු පවරා තිබූ නඩුවක තීන්දුව 2019.05.10 දින ප්‍රකාශයට පත් කරන ලද අතර ඒ අනුව එදිනම ගනුදෙනුකරුට රු. 600 000 ක වන්දියක් ගෙවන ලදී. මෙම නඩුව 2019.01.01 දින පවරා තිබුණි. කෙසේ වුව ද සමාගම මෙම වන්දි සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් 2019.03.31 දිනට හඳුනාගෙන නොතිබුණි. 2019.05.30 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත.

(iii) සමාගම වසරක වගකීම් සහතික කාලයක් සහිතව භාණ්ඩ විකුණනු ලබන අතර පසුගිය වර්ෂය තුළ දී සිදු කරන ලද විකුණුම් වෙනුවෙන් රු. 470 000 ක වගකීම් සහතික වියදම් ප්‍රවර්තන වර්ෂයේ දී ගෙවා ඇත. මෙය ප්‍රවර්තන වර්ෂයෙහි බෙදාහැරීමේ පිරිවැය තුළ ඇතුළත් කර ඇත. 2019.03.31 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය රු. 650 000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි.

(iv) 2018.04.01 දින සමාගම කල්බදු ගිවිසුමකට එළඹුනු අතර වසර 5 ක කාලයක් සඳහා මෝටර් රථයක භාවිත අයිතිය ලබා ගන්නා ලදී. 2018.04.01 දිනට මෝටර් රථයේ භාවිත අයිතියේ පිරිවැය සහ එහි ඵලදායි ජීව කාලය පිළිවෙළින් රු. 5 960 000 ක් සහ වසර 5 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. කල්බදු ගිවිසුමට අනුව 2018.04.01 දින මූලික ගෙවීම ලෙස රු. 2 500 000 ක් ගෙවූ අතර 2019.03.31 දින ප්‍රථම වාර්ෂික වාරිකය ලෙස රු. 1 250 000 ක් ගෙවන ලදී. මූලික මිනුම් කිරීමේ දී කල්බදු වගකීම රු. 3 460 000 ක් විය. 2019.03.31 සහ 2020.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා කල්බදු පොලිය පිළිවෙළින් රු. 346 000 ක් සහ රු. 256 000 ක් වේ. සමාගම විසින් ගෙවන ලද මූලික ගෙවීම සහ ප්‍රථම කල්බදු වාරිකය පමණක් කල්බදු ගෙවීම් ගිණුමේ සටහන් කර තිබුණි. මේ සම්බන්ධව වෙනත් කිසිදු සටහනක් තබා නොමැත.

(v) දේපළ, පිරියත සහ උපකරණවල සංයුතිය සහ ඒවායෙහි සමුච්චිත ක්ෂය පහත පරිදි වේ:

| විස්තරය | 2019.03.31 දිනට පිරිවැය/අගය (රු.'000) | 2018.04.01 දිනට සමුච්චිත ක්ෂය (රු.'000) |
|---|---|---|
| ඉඩම් | 30 000 | - |
| ගොඩනැගිලි | 45 000 | 11 000 |
| කාර්යාල උපකරණ | 15 000 | 4 000 |
| | 90 000 | 15 000 |

(vi) ප්‍රවර්තන වර්ෂය සඳහා ක්ෂය මෙතෙක් වෙන් කර නොමැත. කල්බදු පදනම මත ලබා ගත් මෝටර් රථය බෙදාහැරීමේ කටයුතු සඳහා භාවිත කරනු ලබන අතර ගොඩනැගිලි සහ කාර්යාල උපකරණ පරිපාලන කටයුතු සඳහා භාවිත කෙරේ. කාර්යාල උපකරණ සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 25% බැගින් ක්ෂය කරනු ලබයි. මෝටර් රථයේ සුන්බුන් අගය ශුන්‍ය බව උපකල්පනය කරන්න.

(vii) ප්‍රවර්තන වර්ෂය තුළ දී අත්පත් කරගත් දේපළ, පිරියත සහ උපකරණ පහත පරිදි වේ.

- 2018.07.01 දින : පිරිවැය රු. 10 000 000 ක ඉඩමක්
- 2018.10.01 දින : පිරිවැය රු. 5 000 000 ක කාර්යාල උපකරණ

මෙම අයිතම නිවැරදිව ගිණුම්ගත කර ඇත.

(viii) 2018.04.01 දින ගොඩනැගිලි රු. 38 000 000 කට දෙවන වරට ප්‍රත්‍යාගණනය කරන ලදී. 2014.03.31 දින ප්‍රථම වරට ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කිරීමේ දී රු. 1 500 000 ක ඌනතාවයක් ඇති විය. දෙවන වර ප්‍රත්‍යාගණනයෙන් පසු ගොඩනැගිලිවල ඉතිරි ඵලදායී ජීව කාලය වසර 8 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ගොඩනැගිලිවල සුන්බුන් අගය ශුන්‍ය බව උපකල්පනය කරන්න. දෙවන වර ප්‍රත්‍යාගණනයට අදාළව කිසිදු ගිණුම්කරණ සටහනක් තබා නොමැත.

(ix) වසර තුළ ගෙවූ ආදායම් බදුවල පෙර වර්ෂයට අදාළව ගෙවූ රු. 600 000 ක් ඇතුළත් වේ. 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම රු. 1 920 000 ක් ලෙසට ඇස්තමේන්තු කර ඇත.

(x) රු. 1 500 000 ක අතුරු ලාභාංශ ගෙවීම්, බෙදාහැරීමේ පිරිවැය තුළ ඇතුළත් කර ඇත. 2019.05.30 දින අධ්‍යක්ෂවරු විසින් රු. 1 000 000 ක අවසාන ලාභාංශයක් යෝජනා කරන ලදී.

[තුන්වැනි පිටුව බලන්න.

**අවශ්‍යවන්නේ:**

LKAS 1 (මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම) ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත සනුග පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය
(2) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය
(3) 2019.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

**(මුළු ලකුණු 40 යි)**

2. (අ) සීමිත දයාන් පොදු සමාගම XYZ නැමැති භාණ්ඩයක් නිෂ්පාදනය කරයි. මෙම භාණ්ඩයෙහි සතියක නිෂ්පාදනය ඒකක 300 සිට 500 අතර විචලනය වේ. එය A සහ B යන අමුද්‍රව්‍ය දෙක භාවිත කරමින් නිෂ්පාදනය කරයි. XYZ භාණ්ඩයෙහි එක් ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා A අමුද්‍රව්‍යයෙන් කිලෝ ග්‍රෑම් 10 ක් ද B අමුද්‍රව්‍යයෙන් කිලෝ ග්‍රෑම් 5 ක් ද අවශ්‍ය වේ. පහත තොරතුරු A සහ B අමුද්‍රව්‍යයන්ට අදාළ වේ.

| | A | B |
|---|---|---|
| යළි ඇණවුම් ප්‍රමාණය ........................... | 20 000 | ? |
| යළි ඇණවුම් මට්ටම............................. | 18 000 | ? |
| උපරිම තොග මට්ටම ........................... | ? | 19 000 |
| අවම තොග මට්ටම ............................. | ? | 5 000 |
| **පොරොත්තු කාලය සතිවලින්:** | | |
| අවම .................................................. | 2 | 3 |
| උපරිම ................................................ | 4 | 5 |

**අවශ්‍යවන්නේ:**

(1) අමුද්‍රව්‍ය A සඳහා උපරිම සහ අවම තොග මට්ටම්
(2) අමුද්‍රව්‍ය B සඳහා යළි ඇණවුම් මට්ටම සහ යළි ඇණවුම් ප්‍රමාණය
(3) අමුද්‍රව්‍ය A සහ B සඳහා සාමාන්‍ය තොග මට්ටම්

**(ලකුණු 16 යි)**

(ආ) සීමිත කුමුදු පොදු සමාගම සතුව 'එකලස්' සහ 'නිමැවුම්' යන නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක ද 'ගබඩාව' යන සේවා දෙපාර්තමේන්තුව ද ඇත. ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා අයවැයගත තොරතුරු පහත පරිදි වේ.

| **විස්තරය** | **එකතුව** | **එකලස්** | **නිමැවුම්** | **ගබඩාව** |
|---|---|---|---|---|
| සුපරීක්ෂක වැටුප් (රු.'000) ....................................... | 1 690 | 530 | 730 | 430 |
| කුලිය (රු.'000)........................................................ | 360 | ? | ? | ? |
| විදුලිය (රු.'000)...................................................... | 180 | ? | ? | ? |
| ආරක්ෂක ගාස්තු (රු.'000) ......................................... | 240 | ? | ? | ? |
| යන්ත්‍ර මත ක්ෂය (රු.'000) ......................................... | ? | ? | ? | – |
| භූමි ප්‍රමාණය (වර්ග මීටර)........................................ | 18 000 | 9 000 | 6 000 | 3 000 |
| කිලෝවොට් පැය ..................................................... | 9 000 | 3 000 | 4 500 | 1 500 |
| ආරක්ෂක සේවක සංඛ්‍යාව ......................................... | 12 | 5 | 3 | 4 |
| ශ්‍රම පැය ................................................................ | 21 000 | 7 000 | 14 000 | – |
| යන්ත්‍ර පැය............................................................. | 15 000 | 12 000 | 3 000 | – |
| ඉදිරිපත් කරන ලද අමුද්‍රව්‍ය අධියාචනාපත්‍ර සංඛ්‍යාව.... | 50 | 30 | 20 | – |

**අතිරේක තොරතුරු:**

(i) එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තුවල යන්ත්‍ර පිරිවැය පිළිවෙළින් රු. 450 000 ක් සහ රු. 800 000 ක් වේ. සමාගම විසින් යන්ත්‍ර සරල මාර්ග ක්‍රමයට වාර්ෂිකව 20% බැගින් ක්ෂය කරනු ලැබේ.

(ii) ගබඩා දෙපාර්තමේන්තුවේ මුළු පොදු කාර්ය පිරිවැය, එකලස් සහ නිමැවුම් දෙපාර්තමේන්තු අතර එක් එක් දෙපාර්තමේන්තු විසින් ඉදිරිපත් කරන ලද අමුද්‍රව්‍ය අධියාචනාපත්‍ර සංඛ්‍යාව මත නැවත විභජනය කරනු ලැබේ.

(iii) පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණය කිරීම සඳහා එකලස් දෙපාර්තමේන්තුව යන්ත්‍ර පැය ද නිමැවුම් දෙපාර්තමේන්තුව ශ්‍රම පැය ද යොදා ගැනේ.

/හතරවැනි පිටුව බලන්න.

(iv) සමාගම විසින් මුළු නිෂ්පාදන පිරිවැය මත 20% ක ලාභ ආන්තිකයක් එකතු කර භාණ්ඩ විකුණනු ලැබේ. පහත තොරතුරු සමාගම විසින් නිෂ්පාදනය කරනු ලබන ABC සහ PQR යන භාණ්ඩ හා බැඳේ.

| | | ABC (ඒකකයක් සඳහා) | PQR (ඒකකයක් සඳහා) |
|---|---|---|---|
| ගත කළ සත්‍ය කාලය: | එකලස් දෙපාර්තමේන්තුව (යන්ත්‍ර පැය) | 2 | 4 |
| | නිමැවුම් දෙපාර්තමේන්තුව (ශ්‍රම පැය) | 3 | 2 |
| නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය (රු.) | | ? | ? |
| ප්‍රාථමික පිරිවැය (රු.) | | 380 | ? |
| විකුණුම් මිල (රු.) | | ? | 1 200 |

**අවශ්‍යවන්නේ:**

(1) විභජන පදනම් නම් කරමින් පොදු කාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව (සේවා දෙපාර්තමේන්තුවේ පොදු කාර්ය පිරිවැය නැවත විභජනය ද ඇතුළත්ව)

(2) නිෂ්පාදන දෙපාර්තමේන්තු දෙක සඳහා පොදු කාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත

(3) ABC භාණ්ඩය සඳහා ඒකක නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය සහ ඒකක විකුණුම් මිල

(4) PQR භාණ්ඩය සඳහා ඒකක නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය සහ ඒකක ප්‍රාථමික පිරිවැය

**(ලකුණු 24 යි)**

**(මුළු ලකුණු 40 යි)**

**3.** කමල් විසින් 2018.04.01 දින ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරයේ 2019.03.31 දිනට කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවලින් උපුටා ගන්නා ලද ශේෂයන් පහත දී ඇත.

| | රු.'000 |
|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට | 4 500 |
| තොගය (ගිණුම්කරණ වාර්තා මත පදනම්ව) | 600 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 820 |
| කලින් ගෙවූ කුලී | 480 |
| මුදල් ශේෂය | 610 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 100 |
| උපචිත වියදම් | 90 |
| ලද අත්තිකාරම් | 240 |
| 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය | 580 |
| 2018.04.01 දින හඳුන්වා දුන් ප්‍රාග්ධනය | 6 000 |

ව්‍යාපාරයෙහි සියලු මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් මගින් සිදු කරනු ලැබේ.

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පහත අයිතම සැලකිල්ලට ගෙන නොමැති බව පසුව හෙළිදරව් විය.

(i) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂය රු. 500 000 කි.

(ii) 2019 මාර්තු මාසය සඳහා ප්‍රදර්ශනාගාරයේ කුලිය රු. 80 000 ක් කලින් ගෙවූ කුලී ගිණුමෙහි ඇතුළත් කර ඇත.

(iii) 2019 මාර්තු මාසය සඳහා රු. 5 000 ක විදුලි බිල 2019.03.31 දිනට ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොතිබුණි.

(iv) 2019.03.30 දින පිරිවැය රු. 80 000 ක ණයට මිල දී ගත් භාණ්ඩ, ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි.

(v) 2019.03.30 දින පිරිවැය රු. 200 000 ක භාණ්ඩ රු. 400 000 ක අත්පිට මුදලට විකිණීම ගිණුම් පොත්වල සටහන් කර නොතිබුණි. කෙසේ වුව ද මේ සඳහා ලද චෙක්පත 2019.04.01 දින බැංකුවෙහි තැන්පත් කර තිබුණි.

(vi) පිරිවැය රු. 40 000 ක තොග අයිතම වර්ෂය තුළ දී විනාශ වූ අතර එම අයිතම විකිණිය හැකි තත්ත්වයක නොතිබුණි. කෙසේ වුව ද මෙම අයිතම පිරිවැයට 2019.03.31 දිනට තොගයේ ඇතුළත්ව තිබුණු අතර ඒවාට උපලබ්ධි අගයක් නොවී ය.

(vii) අයිතම 40 ක් මිලට ගැනීම සඳහා ගනුදෙනුකරුවකු විසින් ඇණවුමක් ඉදිරිපත් කරන ලදී. එම භාණ්ඩවල විකුණුම් මිල රු. 240 000 ක් වූ අතර මෙම මුදල වර්ෂය තුළ දී ලැබී ඇත. මෙම මුදල, ලද අත්තිකාරම් ගිණුමේ සටහන් කර ඇත. කෙසේ වුව ද මෙම අයිතමවලින් අඩක් පමණක් 2019.03.31 දින වන විට ගනුදෙනුකරුට බෙදාහැර ඇති අතර ඒවායේ පිරිවැය රු. 80 000 කි. තවද මෙම බෙදාහැරීමට අදාළ කිසිදු සටහනක් තබා නොමැත. ඉතිරි භාණ්ඩ බෙදාහැරිය යුත්තේ ඉදිරි වර්ෂය තුළ දී ය.

[පස්වැනි පිටුව බලන්න.

(viii) 2019.03.28 දින ණයගැතියෙකුගෙන් ලද රු. 20 000 ක චෙක්පතක් බැංකුව විසින් 2019.03.31 දින අගරු කර ඇති බව 2019.04.03 ලද බැංකු ප්‍රකාශනයෙන් හෙළිදරව් විය.

(ix) තවද 2019.03.31 දින ණයගැතියෙකු විසින් රු. 50 000 ක චෙක්පතක් බැංකුවේ සෘජුව තැන්පත් කර ඇති බව බැංකු ප්‍රකාශනය තුළින් අනාවරණය විය. කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී මෙම මුදල අයකර ගත නොහැකි වටිනාකමක් ලෙස කපා හැර තිබුණි.

(x) ව්‍යාපාරය විසින් ගෙවූ අයිතිකරුගේ දරුවකුගේ විභාග ගාස්තු රු. 2 000 ක් බැංකු ප්‍රකාශනයෙන් හෙළිදරව් විය.

**අවශ්‍යවන්නේ:**

(1) අංක (i) සිට (x) දක්වා අයිතමවල බලපෑම (අගයන් සහිතව) ගිණුම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කර, එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (–) ද යන්න සඳහන් කරන්න. (පිළිතුරු සැපයීමේ දී පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

**(රු.'000)**

| අයිතම අංක | වත්කම් | | | | | වගකීම් | | | හිමිකම් |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දේපළ, පිරියත සහ උපකරණ | තොග | වෙළෙඳ ලැබිය යුතු දෑ | කලින් ගෙවූ කුලී | මුදල් | වෙළෙඳ ගෙවිය යුතු දෑ | උපචිත වියදම් | ලද අත්තිකාරම | |
| ශේෂය | 4 500 | 600 | 820 | 480 | 610 | 100 | 90 | 240 | 6 580 |
| (i) | | | | | | | | | |
| (ii) | | | | | | | | | |
| ...... | | | | | | | | | |
| ...... | | | | | | | | | |
| සංශෝධිත ශේෂය | | | | | | | | | |

(2) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කෙටුම්පත් ලාභය නිවැරදි කිරීම දක්වන ප්‍රකාශනයක්

(3) ඉහත අයිතම අංක (ii), (iii), (iv), (ix) සහ (x) නිවැරදි කිරීම/සටහන් කිරීම සඳහා ජර්නල් සටහන් (සංලක්ෂය සහිතව)

**(මුළු ලකුණු 40 යි)**

4. (අ) මදාරා වෙළෙන්දෝ එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇති ආයතනයකි. පහත ශේෂ 2018.12.31 දිනට ආයතනයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් උපුටා ගන්නා ලදී.

| | රු. |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ .............................. | 120 000 |
| මුදල් .................................................. | 30 000 |
| වෙළෙඳ ණයහිමියෝ .............................. | 70 000 |
| ගෙවිය යුතු VAT.................................... | 30 000 |

පහත ගනුදෙනු 2019.01.31 දිනෙන් අවසන් මාසයේ දී මෙම ආයතනයේ සිදු වී ඇත.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2019.01.05 | සීමිත අමල් (පුද්ගලික) සමාගමෙන් රු. 230 000 ක භාණ්ඩ ණයට මිලට ගන්නා ලදී. (මෙම මිල දී ගැනීම තුළ VAT රු. 30 000 ක් ඇතුළත් වේ.) |
| 2019.01.10 | රු. 150 000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 207 000 කට අත්පිට මුදලට විකුණන ලදී. (මෙම විකුණුම තුළ VAT රු. 27 000 ක් ඇතුළත් වේ.) |
| 2019.01.12 | 2018.12.31 දිනට ණයගැති ශේෂය සම්පූර්ණයෙන් පියවන පරිදි වට්ටමකට යටත්ව රු. 110 000 ක් ලැබුණි. |
| 2019.01.15 | 2018.12.31 දිනට වෙළෙඳ ණයහිමියන්ට ගෙවිය යුතු මුළු මුදල පියවන ලදී. |
| 2019.01.16 | සීමිත අමල් (පුද්ගලික) සමාගමට ගෙවිය යුතු මුදල පියවන ලද අතර රු. 5 000 ක වට්ටමක් ලැබුණි. |
| 2019.01.18 | රු. 360 000 ක ලකුණු කළ මිලක් සහිත භාණ්ඩ රු. 345 000 කට නාදන් වෙළෙඳුන්ගෙන් ණයට මිල දී ගන්නා ලදී. (මෙම මිල දී ගැනීම තුළ VAT රු. 45 000 ක් ඇතුළත් වේ.) |

[හයවැනි පිටුව බලන්න.

| | |
|---|---|
| 2019.01.20 | රු. 350 000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 460 000 කට සීමිත ජයමාල් පොදු සමාගමට ණයට විකුණන ලදී. (මෙම විකුණුම තුළ VAT රු. 60 000 ක් ඇතුළත් වේ.) |
| 2019.01.28 | රු. 60 000 ක කාර්යාල වියදම් ගෙවන ලදී. |
| 2019.01.30 | සීමිත ජයමාල් පොදු සමාගමෙන් ලැබිය යුතු මුදලෙන් කොටසක් පියවීම සඳහා රු. 360 000 ක් ලැබුණි. |

වියදම් සඳහා VAT නොමැති බව උපකල්පනය කරන්න.

**අවශ්‍යවන්නේ:**

(1) 2019.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ව්‍යාපාරයේ පහත මූලික සටහන් පොත්:

(i) මුදල් ලැබීම් ජර්නලය
(ii) මුදල් ගෙවීම් ජර්නලය
(iii) ගැනුම් ජර්නලය

(2) 2019.01.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත ගිණුම්:

(i) වෙළෙඳ ණයගැති පාලන ගිණුම
(ii) වෙළෙඳ ණයහිමි පාලන ගිණුම
(iii) VAT පාලන ගිණුම
(iv) මුදල් ගිණුම

**(ලකුණු 20 යි)**

(ආ) 2019 මාර්තු මාසය සඳහා පහත තොරතුරු සුහද ක්‍රීඩා සමාජය හා බැඳේ. මෙම ක්‍රීඩා සමාජය ලාභ අරමුණකින් තොරව පවත්වාගෙන යනු ලබයි.

| **විස්තරය** | **2019.03.31 දිනට (රු.'000)** | **2019.02.28 දිනට (රු.'000)** |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ (ධාරණ වටිනාකමට) | 1 000 | 800 |
| ලැබිය යුතු සාමාජික මුදල් | 60 | 40 |
| කලින් ලද සාමාජික මුදල් | ? | 100 |
| බැංකුවේ ඇති මුදල් | ? | 80 |
| සමුච්චිත අරමුදල | ? | 820 |

පහත ගනුදෙනු 2019.03.31 දිනෙන් අවසන් මාසය තුළ ක්‍රීඩා සමාජයෙහි සිදු විය.

(i) සාමාජික මුදල් රු. 300 000 ක් ලැබුණි. (මාසය මුල ලැබිය යුතු සාමාජික මුදල් රු. 40 000 ක් සහ 2019 අප්‍රේල් මාසය සඳහා ලද රු. 70 000 ක් ද මෙහි ඇතුළත් වේ.)

(ii) මාසය තුළ නව සාමාජිකයින් 14 ක් ක්‍රීඩා සමාජයට ඇතුළත් වූ අතර එක් අයකු රු. 10 000 බැගින් ඇතුළත් වීමේ ගාස්තු ගෙවා ඇත.

(iii) 2019.03.01 දින රු. 300 000 ක පිරිවැයකට කාර්යාල උපකරණ අත්පිට මුදලට මිල දී ගන්නා ලදී.

(iv) රු. 180 000 ක වැටුප් ගෙවන ලදී. (2019.03.31 දිනට ගෙවිය යුතු වැටුප් රු. 30 000 කි).

ක්‍රීඩා සමාජය එහි සියලුම මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් මගින් සිදු කරනු ලබයි. ක්‍රීඩා සමාජයේ 2019.02.28 දින මුදල් ශේෂය එදිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය සමග එකඟ විය. කෙසේ වුව ද 2019.03.31 දිනට බැංකු ප්‍රකාශනයේ ශේෂය, එදිනට මුදල් ගිණුමේ ශේෂය සමග එකඟ නොවී ය. බැංකු ප්‍රකාශනයට අනුව 2019 මාර්තු මාසය තුළ දී පහත ගනුදෙනු සිදු වී ඇත.

| | රු. |
|---|---|
| උපලබ්ධි වූ චෙක්පත් ................................................ | 400 000 |
| ගෙවීමට ඉදිරිපත් කළ චෙක්පත් .................................... | 350 000 |
| බැංකුවෙහි සෘජුව තැන්පත් කරන ලද පරිත්‍යාගය ............ | 20 000 |
| කාර්යාල කුලිය සඳහා ස්ථාවර නියෝග ගෙවීම ............. | 10 000 |

පරිත්‍යාගය සඳහා වූ සෘජු තැන්පතුව සහ කාර්යාල කුලිය සඳහා ස්ථාවර නියෝග ගෙවීම බැංකු ප්‍රකාශනය ලැබීමෙන් පසුව මුදල් ගිණුමෙහි සටහන් කර ඇත. පරිත්‍යාග සහ ඇතුළත් වීමේ ගාස්තු ඒවා ලද මාසය තුළ දී ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ.

**අවශ්‍යවන්නේ:**

(1) 2019.03.31 දිනෙන් අවසන් මාසය සඳහා මුදල් ගිණුම

(2) 2019 මාර්තු මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය

(3) 2019.03.31 දිනෙන් අවසන් මාසය සඳහා ආදායම් ප්‍රකාශනය

(4) 2019.03.31 දිනට කලින් ලද සාමාජික මුදල් සහ සමුච්චිත අරමුදල

**(ලකුණු 20 යි)**

**(මුළු ලකුණු 40 යි)**

5. **(අ)** නදී සහ ගංගා 2018.04.01 දින සුපිරි වෙළෙඳසැලක් පවත්වාගෙන යාම සඳහා හවුල් ව්‍යාපාර ගිවිසුමකට එළඹෙන ලදී. එදිනම ඔවුන් පහත වත්කම් ඔවුන්ගේ ප්‍රාග්ධනය ලෙස ව්‍යාපාරයට ගෙන එන ලදී:

| | **නදී** | **ගංගා** |
|---|---|---|
| | **(රු.'000)** | **(රු.'000)** |
| ඉඩම් | 1 500 | – |
| ගොඩනැගිලි | 1 000 | 1 000 |
| කාර්යාල උපකරණ | – | 1 000 |
| මුදල් | 500 | – |

හවුල් ගිවිසුමෙහි කොන්දේසි පහත පරිදි වේ:

- හවුල්කරුවන් අතර ලාභාලාභ ඔවුන් විසින් 2018.04.01 දින හඳුන්වා දුන් ප්‍රාග්ධනයේ අනුපාතයට බෙදාගනු ලබයි.
- සෑම හවුල්කරුවකුම හවුල් ව්‍යාපාරය ආරම්භ කරන ලද දින සිට පළමු මාස හය සඳහා රු. 50 000 බැගින් වූ මාසික වේතනයකට සහ ඉන් පසුව රු. 60 000 ක් බැගින් වූ මාසික වේතනයකට හිමිකම් ලබයි.
- හවුල්කරුවන් විසින් ව්‍යාපාරයට සපයන ලද ණය සඳහා වාර්ෂිකව 8% ක පොලියකට හිමිකම් ලබයි.
- ව්‍යාපාරය තුළ කීර්තිනාම ගිණුමක් පවත්වා නොගන්නා අතර හවුල් ව්‍යාපාරයෙහි කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැළපිය යුතු වේ.

2019.03.31 දිනට ව්‍යාපාරයෙහි සාරාංශගත ශේෂ පිරික්සුම පහත පරිදි වේ.

| **විස්තරය** | **හර (රු.'000)** | **බැර (රු.'000)** |
|---|---|---|
| විකුණුම් | | 5 000 |
| විකුණුම් පිරිවැය | 1 800 | |
| 2019.03.31 දිනට තොගය | 400 | |
| මෙහෙයුම් වියදම් | 1 200 | |
| දේපළ, පිරියත සහ උපකරණ | 4 500 | |
| ක්ෂය | 200 | |
| සමුච්චිත ක්ෂය | | 200 |
| 2019.01.01 දින නදී විසින් ලබා දුන් ණය | | 1 500 |
| ගෙවූ රක්ෂණ වාරික | 500 | |
| හවුල්කරුවන්ට ගෙවූ වේතන: | | |
| නදී | 300 | |
| ගංගා | 500 | |
| ප්‍රාග්ධන ගිණුම්: | | |
| නදී | | 3 000 |
| ගංගා | | 2 000 |
| සාගර ලබා දුන් මුදල | | 1 500 |
| මුදල් | 3 800 | |
| | **13 200** | **13 200** |

[අටවැනි පිටුව බලන්න.

**අතිරේක තොරතුරු:**

(i) වර්ෂය තුළ දී නදී විසින් රු. 80 000 ක පිරිවැය වූ භාණ්ඩ ව්‍යාපාරයෙන් ලබාගෙන ඇත. මෙය ව්‍යාපාරයේ ගිණුම් පොත්වල සටහන් කර නොමැත.

(ii) වර්ෂය තුළ දී ගංගා විසින් සිය පෞද්ගලික මුදල් භාවිත කර මිල දී ගත් පිරිවැය රු. 400 000 ක භාණ්ඩ හවුල් ව්‍යාපාරයට ලබා දී ඇත. මෙම භාණ්ඩවල පිරිවැය ගංගා විසින් ව්‍යාපාරයට කරන ලද ප්‍රාග්ධන දායකත්වයක් ලෙස සැලකීමට තීරණය කරන ලදී. නමුත් මේ සම්බන්ධයෙන් පොත්වල කිසිදු සටහනක් කර නොමැත. කෙසේ වුව ද මෙම සියලු භාණ්ඩ වර්ෂය තුළ දී විකුණා ඇති අතර විකුණුම් ගිණුමෙහි සටහන් කර ඇත.

(iii) නදී විසින් ලබා දුන් ණය සඳහා පොලිය ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොමැත.

(iv) ගංගාගේ පෞද්ගලික ආදායම් බද්ද වූ රු. 65 000 ක් ව්‍යාපාරය විසින් ගෙවා ඇත. මෙය ව්‍යාපාරයෙහි මෙහෙයුම් වියදමක් ලෙස සටහන් කර ඇත.

(v) ව්‍යාපාරය විසින් ගෙවූ රක්ෂණ වාරිකවල සංයුතිය පහත පරිදි වේ:
* සුපිරි වෙළෙඳසැල සඳහා ගිනි රක්ෂණය - රු. 300 000
* නදීගේ ජීවිත රක්ෂණය - රු. 200 000

(vi) 2019.03.31 දින සාගර හවුල්කරුවකු ලෙස ව්‍යාපාරයට බැඳුණි. ඔහු රු. 1 500 000 ක් ප්‍රාග්ධනය ලෙස හවුල් ව්‍යාපාරයට යෙදවූ අතර එය වෙනම ගිණුමක සටහන් කර ඇත. නදී, ගංගා සහ සාගර අතර නව ලාභාලාභ අනුපාතය පිළිවෙළින් 3 : 2 : 1 ක් වේ. මෙදිනට ව්‍යාපාරයෙහි කීර්තිනාමය රු. 600 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. කෙසේ වුව ද මෙය ගිණුම්ගත කර නොමැත.

**අවශ්‍යවන්නේ:**

(1) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට කරන ලද විසර්ජනයන් ද සහිතව)

(2) 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්

**(ලකුණු 20 යි)**

**(ආ)** පාසලක් එහි ගුරුවරුන්ගේ වාර්ෂික චාරිකාව සැලසුම් කරමින් සිටී. පාසලෙහි ගිණුම්කරණ ගුරුවරයා විසින් චාරිකාව සඳහා පහත තොරතුරු ඇස්තමේන්තු කර ඇත.

| | | |
|---|---|---|
| ගුරුවරයකුගෙන් අය කරන ගාස්තුව | රු. | 1 500 |
| ආසන 40 ක ධාරිතාවයක් සහිත එක් බසයක කුලිය | රු. | 40 000 |
| එක් බසයක රියදුරු සහ සහායකට දීමනා | රු. | 2 000 |
| එක් ගුරුවරයකු සඳහා සංග්‍රහ වියදම් | | ? |
| මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා අවශ්‍ය ගුරුවරු සංඛ්‍යාව | | 100 |
| චාරිකාව සඳහා අපේක්ෂිත උපරිම ගුරුවරු සංඛ්‍යාව | | 120 |

එක් බසයක ගමන් කරන ගුරුවරු සංඛ්‍යාව එහි ආසන ධාරිතාවයට සීමා කෙරේ.

**අවශ්‍යවන්නේ:**

(1) චාරිකාවේ මුළු ස්ථාවර පිරිවැය

(2) ගුරුවරයකුගේ දායකය

(3) ගුරුවරයකු සඳහා සංග්‍රහ වියදම

(4) චාරිකාවෙහි ආරක්ෂිත ආන්තිකය (සංඛ්‍යාව සහ රුපියල් වටිනාකම)

(5) අපේක්ෂිත උපරිම ගුරුවරු සංඛ්‍යාව සහභාගි වන්නේ නම් චාරිකාවෙන් ලැබෙන අතිරික්තය

(6) ගුරුවරුන් 90 ක් පමණක් සහභාගි වන්නේ නම් මුළු පිරිවැය ආවරණය කිරීම සඳහා ගුරුවරයකුගෙන් අය කළ යුතු ගාස්තුව

**(ලකුණු 20 යි)**

**(මුළු ලකුණු 40 යි)**

/නවවැනි පිටුව බලන්න.

**6.** **(අ)** පහත තොරතුරු 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත අනුර පොදු සමාගමට අදාළ වේ.

| | රු.'000 |
|---|---|
| විකුණුම් ආදායම ............................... | 9 000 |
| වර්ෂය සඳහා ලාභය .......................... | 600 |
| ආදායම් බදු වියදම ........................... | 40 |
| පොලී වියදම් ................................... | 80 |

තවද 2019.03.31 දිනට පහත ශේෂ ද පැවතුණි.

| | රු.'000 |
|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය (නිකුත් කළ මුළු කොටස් සංඛ්‍යාව 150 000) ...................... | 4 200 |
| මුළු වත්කම් ..................................................................................................... | 8 400 |

2018.04.01 දිනට මුළු වත්කම් සහ රඳවාගත් ඉපැයුම් පිළිවෙළින් රු. 6 600 000 ක් සහ රු. 1 200 000 ක් විය. 2019.03.31 දිනට සමාගමේ වගකීම්, දිගුකාලීන ණයවලින් පමණක් සමන්විත වූ බව උපකල්පනය කරන්න.

**අවශ්‍යවන්නේ:**

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත **අනුපාත** ගණනය කිරීම:

(1) ශුද්ධ ලාභ

(2) පොලී ආවරණ

(3) හිමිකම් මත ප්‍රතිලාභ

(4) කොටසක ඉපැයුම්

(5) ණය හිමිකම්

**(ලකුණු 10 යි)**

**(ආ)** සීමිත කැළුම් පොදු සමාගම පැරණි යන්ත්‍රයක් වෙනුවට නව යන්ත්‍රයක් අත්පත් කර ගැනීමට සලකා බලමින් සිටියි. සමාගමේ කළමනාකරණ ගණකාධිවරයා විසින් නව යන්ත්‍රය සම්බන්ධයෙන් පහත ඇස්තමේන්තුගත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| ගැනුම් මිල | රු. 1 200 000 |
| ඵලදායී ජීව කාලය | වසර 5 |
| සුන්බුන් අගය | රු. 200 000 |
| ස්ථාපනය කිරීමේ ගාස්තුව | රු. 75 000 |
| වැඩ බිම සකස් කිරීමේ වියදම් | රු. 125 000 |
| වාර්ෂික නඩත්තු පිරිවැය | රු. 100 000 |

**අතිරේක තොරතුරු:**

(i) නව යන්ත්‍රයේ අතිරේක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය රු. 300 000 ක් වන අතර මෙම ව්‍යාපෘතිය අවසානයේ දී එය නැවත ලබා ගත හැකි ය.

(ii) නව යන්ත්‍රය නිසා මෙහෙයුම් පිරිවැයේ අපේක්ෂිත වාර්ෂික ඉතිරිය රු. 500 000 කි.

(iii) නව යන්ත්‍රය මිල දී ගතහොත් පැරණි යන්ත්‍රය ව්‍යාපෘතිය ආරම්භයේ දී රු. 400 000 කට විකිණිය හැකි යැයි ඇස්තමේන්තු කර ඇත.

(iv) මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 12% කි.

(v) 12% වට්ටම් සාධක:

| **වසර** | 1 | 2 | 3 | 4 | 5 |
|---|---|---|---|---|---|
| **වට්ටම් සාධකය** | 0.89 | 0.80 | 0.71 | 0.64 | 0.57 |

**අවශ්‍යවන්නේ:**

(1) ව්‍යාපෘතියෙහි මුදල් ගලා ඒම් සහ මුදල් ගලා යාම් ලේඛනය සහ එහි ශුද්ධ වර්තමාන අගය

(2) ශුද්ධ වර්තමාන අගය පදනම්ව නව යන්ත්‍රය මිල දී ගත යුතු ද යන නිර්දේශය

**(ලකුණු 10 යි)**

**(ඉ)** සීමිත නිහාල් පොදු සමාගමේ වත්කම් සහ වගකීම් ශේෂ කිහිපයක් පහත පරිදි විය.

| **විස්තරය** | **2019.03.31 දිනට (රු.)** | **2018.03.31 දිනට (රු.)** |
|---|---|---|
| වෙළෙඳ ලැබිය යුතු දෑ | 250 000 | 180 000 |
| වෙළෙඳ ගෙවිය යුතු දෑ | 110 000 | 140 000 |
| ගෙවිය යුතු මෙහෙයුම් වියදම් | 15 000 | – |
| මුදල් සහ මුදල් සමාන දෑ | ? | 120 000 |

2019.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී මෙම සමාගමේ පහත ගනුදෙනු සිදු විය:

(i) වර්ෂය සඳහා මුළු විකුණුම් සහ ගැනුම් පිළිවෙළින් රු. 1 200 000 ක් සහ රු. 550 000 ක් විය. (සියලුම ගැනුම් සහ විකුණුම් ණය පදනම මත සිදු කෙරේ.)

(ii) වර්ෂය තුළ වෙළෙඳ ණයගැතියන්ට ලබාදුන් මුදල් වට්ටම් රු. 30 000 ක් විය.

(iii) රු. 35 000 ක ක්ෂයවීම් ද ඇතුළත්ව වර්ෂය සඳහා මුළු මෙහෙයුම් වියදම් රු. 95 000 ක් විය.

(iv) වර්ෂය සඳහා පොලී සහ ආදායම් බදු වියදම් පිළිවෙළින් රු. 25 000 ක් සහ රු. 65 000 ක් විය. වර්ෂය තුළ ගෙවූ පොලී සහ ගෙවූ ආදායම් බදු පිළිවෙළින් රු. 20 000 ක් සහ රු. 75 000 ක් විය.

(v) වර්ෂය තුළ ගෙවන ලද මුළු අතුරු ලාභාංශ රු. 60 000 ක් විය.

(vi) වර්ෂය තුළ සමාගම එකක් රු. 20 බැගින් සාමාන්‍ය කොටස් 30 000 ක් නිකුත් කරන ලදී. මෙම කොටස් නිකුත් කිරීම් තුළ රු. 200 000 ක සංචිත ප්‍රාග්ධනිත කිරීමක් ද ඇතුළත් විය. නිකුත් කළ ඉතිරි කොටස් සඳහා ලැබිය යුතු මුදල වසර තුළ ලැබී ඇත.

(vii) වර්ෂය තුළ දිගුකාලීන ණයවලින් කොටසක් පියවීම සඳහා රු. 220 000 ක් සමාගම විසින් ගෙවා ඇත.

(viii) 2018.04.01 දින සමාගම විසින් නව මෝටර් රථයක් අත්පිට මුදලට මිල දී ගෙන ඇත. එදිනම රු. 80 000 ක ලාභයක් සහිතව කාර්යාල උපකරණයක් රු. 250 000 කට අත්පිට මුදලට විකුණා ඇත. මෙම ගනුදෙනු හා ක්ෂයවීම්වල ශුද්ධ ප්‍රතිඵලයක් ලෙස වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණවල ධාරණ වටිනාකම රු. 205 000 කින් ඉහළ ගොස් ඇත.

**අවශ්‍යවන්නේ:**

LKAS 7 (මුදල් ප්‍රවාහ ප්‍රකාශනය) ප්‍රමිතයට අනුව 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය (මෙහෙයුම් මුදල් ප්‍රවාහ හඳුනාගැනීම සඳහා සෘජු ක්‍රමය භාවිත කරන්න.)

**(ලකුණු 20 යි)**

**(මුළු ලකුණු 40 යි)**

* * *